# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2058/33 - 2018 පෙබරවාරි මස 15 වැනි බ්‍රහස්පතින්දා - 2018.02.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත**

3 වැනි වගන්තිය යටතේ නියමය

1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශෙෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය මංගල සමරවීර වන මම, මෙම නියෝගය මගින් එම වගන්තිය යටතේ පනවන ලද 2017.11.09 වැනි දිනැති අංක 2044/32 දරන අති විශෙෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද උපලේඛනය (II) හි සඳහන් අයිතම අංක 1 (අ) පහත උපලේඛනය පරිදි සංශෝධනය කරමි.

මෙම නියෝගය 2018 පෙබරවාරි මස 16 දින සිට ක්‍රියාත්මක වේ.

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය.

2018 පෙබරවාරි මස 15 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.

*උපලේඛනය*

| | *විස්තරය* | *නිෂ්පාදන බද්ද* |
|---|---|---|
| (අ) | රජයේ නිලධාරියකු විසින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99 සහ එයට යා කරන ලද සංශෝධන වලට අනුව නිකුත් කරන ලද බලපත්‍රයක් උපයෝගී කරගෙන, ඉහත චක්‍රලේඛයේ විස්තර කර ඇති පරිදි අදාළ නිලධාරියා විසින් දරන ලද තනතුර මත පහත සඳහන් කාණ්ඩ යටතේ වර්ගීකරණය කරන ලද | |
| | කාණ්ඩ I | ගෙවිය යුතු බදු ප්‍රමාණයෙන් රු. මිලියන 22.0 ක් අඩු කිරීම (එනම්, ගෙවිය යුතු බදු ප්‍රමාණය - රු. මිලියන 22.0) |
| | කාණ්ඩ II | ගෙවිය යුතු බදු ප්‍රමාණයෙන් රු. මිලියන 16.0 ක් අඩු කිරීම (එනම්, ගෙවිය යුතු බදු ප්‍රමාණය - රු. මිලියන 16.0) |
| | කාණ්ඩ III | ගෙවිය යුතු බදු ප්‍රමාණයෙන් රු. මිලියන 12.0 ක් අඩු කිරීම (එනම්, ගෙවිය යුතු බදු ප්‍රමාණය - රු. මිලියන 12.0) |


1A - PG 3919 — 557 (2018/02)        ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*